# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

**No:** 24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** +94 11 2565304 – 6, 5552746, 5552749, **Fax:** +94 114714460
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org


**උතුරු පළාත් සභා ඡන්ද විමසීම 2013**

**මාධ්‍ය නිවේදනය - අංක 03**

2013 සැප් 17, මධ්‍යම රාත්‍රී 12.45

**උතුරු පළාතේ ,යාපනය මැතිවරණ දිස්ත්‍රික්කයේ , කරෙයිනගර් මැතිවරණ කොට්ඨාශයේ කෝවලම් ප්‍රදේශය**

කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ සභාපති වේලායුදම් ආනෙයිමුගම්ගේ (දෙ.ජා.ස) නිවසට අළුයම 12.45 ට පමණ ගල් මුල් ප්‍රහාරයක් එල්ල වී ඇත. ආනෙයිමුගම් මහතා දැක්වු පරිදි සිවකාමි අම්මන් කෝවිල අසල පැවැති දෙ.ජා.ස මැතිවරණ රැලියක් අවසන්ව පෙර දින රාත්‍රි 10.30 ට පමණ නිවස කරා පැමිණෙන අතරතුර (2013 සැප්තැම්බර් 16) තම නිවස ඉදිරිපිට යතුරු පැදි තුනකින් පැමිණි පුද්ගලයින් හය දෙනෙකු පමණ සිටිනු දැක ඇත. ඔහු පැමිණෙනු දැක ඇති මෙකී පුද්ගලයින් අදාල ස්ථානයෙන් පළා ගිය බවට ඔහු චෝදනා කරයි.

ආනේයිමුගන් මහතා තවදුරටත් අදහස් ප්‍රකාශ කරමින් පැවැසුවේ ඔහුට එක් යතුරු පැදියක අංකය පමණක් (ලියාපදිංචි අංකය VI 6465) හඳුනාගැනිමට හැකි වු බවයි. එසේ වුවත් එහි සිටි පුද්ගලයන් කිහිප දෙනෙකු හමුදා බුද්ධි අංශයට අනුයුක්ත සාමාජිකයන් ලෙස ඔහු හඳුනාගෙන ඇත. පොලිස් හදිසි ඇමතුම් ඒකකය වෙත ඔහු ඒ පිළිබඳ දන්වා ඇති අතර විධිමත් පැමිණිල්ලක් පොලිසිය වෙත මෙතෙක් ඉදිරිපත් කර නැත.

කයිට්ස් පොලිසිය ඇමතු අවස්ථාවේ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත දන්වා සිටියේ අදාල සභාපතිවරයාගේ නිවසට ප්‍රහාරයක් එල්ල වී ඇති බවට පැමිණිල්ලක් ලැබුනු බවත් ඒ පිළිබඳ විමර්ශනයට පොලිස් කණ්ඩායමක් අදාල ස්ථානය කරා අලුයම 1.30 පමණ පිටත් කරන ලද බවයි.

පොලිසිය තව දුරටත් පැවැසුවේ අදාළ අවස්ථාවේදි තමන් වෙත ප්‍රකාශයක් ලබා දීම සභාපතිවරයා විසින් ප්‍රතික්ෂේප කළ බවත් පසු දිනයේ එය ලබා දෙන ලෙස දැන්වුවත් මෙදින තුල ඔහු ඒ සදහා නොපැමිණි බවත්ය. එමෙන්ම පොලිසිය පැවැසුවේ එය මැතිවරණයට අදාල සිදුවිමක් ද යන්න ගැන හෝ චෝදනා කරන පුද්ගලයන් හමුදා බුද්ධි අංශයට අයත් දැයි යන්න ගැන හෝ තමන් නොදන්නා බවයි.

| | | |
|---|---|---|
| ආචාර්ය පී. සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කළුපතිරණ |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |